SOP (M)
Annexure - 02

*MicroChem Laboratories (Pvt.) Ltd.*
No.112/1, 1/1,Stanley Thilakarathne Mawatha
,Nugegoda.

# INSTRUCTION FOR SAMPLE COLLECTION FOR MICROBIOLOGICAL ANALYSIS

## *1. GENERAL*

Sample for microbiological analysis must only be collected in sterile bottles or bags. Collect samples that are representative of the water /food being tested, and use aseptic techniques to avoid sample contamination. When sample is collected, leave ample air space in the bottle (at least 2.5 cm), and an identification number shall be marked on each container.

### *1.1 ORDER OF TAKING SAMPLE*

When a number of samples for various purposes are being collected from same sampling point, the sample for **microbiological examination should be collected first.**

## *2. WATER*

### *2.1 SIZE OF THE SAMPLE*

The volume of a sample shall be at least 3/4 of the bottle for water& beverage, 250g for food items.

### *2.2 OPENING AND FILLING THE BOTTLE*

The bottles shall be kept unopened until moment it is required for filing. During sampling, the bottle shall be held by the base in one hand, while the other hand the stopper and cover are removed together, The bottle shall be filed, without rinsing, and the stopper shall be replaced immediately.

### *2.3 TRANSPORT AND STORAGE OF SAMPLE*

Examination of bacteriological quality shall preferably be started within 1 hour of Collection of sample. In any case the interval between collection of the sample and beginning of the examination shall not be exceed 24 hours.
If the time interval between collection and examination is to exceed 1 hour the sample shall be transported to laboratory in iced cooler (ideally sample should be held Less than 6 $^0$C). Sample shall not be frozen.

## *3. FOOD & OTHER*

### 3.1 SAMPLE COLLECTION

**Finish products** - Consumer package of foods should be sampled from original previously unopened container.
**Bulk liquid material** - Aseptically transfer a representative sample portion to a sterile container.
**Bulk solid or semi solid** - Aliquots from several areas of the food under examination should be taken to ensure a representative samples sterile spoon or spatula should be used.
**Frozen bulk material** - Obtain sample from few areas of the food with a sterile sharp sampling Instrument.

### 3.2 TRANSPORT & STORAGE

Sample should be delivered to the laboratory as soon as possible. Refrigerated products must be transported & stored in refrigerated condition 4 ±2 $^0$C and frozen product be transported and stored in frozen state.

**N.B.**
**For Chemical analysis , water samples should be provided in a separate bottle. Volume should not be less than 1L.**

SOP (M)
Annexure - 02

# මයික්‍රොකෙම් ලැබොරටරීස් (පුද්ගලික) සමාගම

නො. 112/1A 1/1, ස්ටැන්ලි තිලකරත්න මාවත
නුගේගොඩ

## ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ සඳහා ජලය හා ආහාර නියැදි එකතු කිරීමේදී පිලිපැදිය යුතු උපදෙස්.

1. ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සඳහා සාම්පල් එකතුකිරීමට ජීවාණුහරිත බෑග් හෝ බෝතල් පාවිච්චි කළයුතුය.
2. සාම්පල් එකතු කිරීමේදි සම්පූර්ණ නියැදියම නියෝජනය වන පරිදි එකතුකිරීමට වගබලාගන්න. සාම්පල් එකතු කරන බෝතල්වල හෝ බෑග් වල සාම්පලය එකතු කිරීමෙන් පසුව සැලකියයුතු හිස් අවකාශයක් ඉතිරිවිය යුතුය. නිවැරදි ලෙස සාම්පලය හඳුනාගැනීම සඳහා ලේබලයක් අලවන්න.
3. විවිධ පරීක්ෂණ සඳහා එකම ස්ථානයකින් සාම්පල එකතුකරන විට ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සඳහා ගන්නා සාම්පල මුලින්ම එකතු කලයුතුය.

### 1.0. ජල සාම්පල ලබාගැනීම.

1. ජල සාම්පලයේ පරිමාව අවම වශයෙන් බෝතලයෙන් තුන්කාලක් පමණ විය යුතුය.
2. සාම්පලය එකතුකරන මොහොත තෙක් බෝතලයේ පියන විවෘත නොකල යුතුය.
   එක අතකින් බෝතලයේ පතුලෙන් අල්ලා අනෙක් අතින් ඇලුමිනියම් කවරයද සමග බෝතලයේ පියන විවෘත කරන්න. නැවත සේදීමකින් තොරව ජලසාම්පලය බෝතලයට එකතු කරන්න.

### 1.1. කරාමයකින් ජලය එකතු කිරීම.

කරාමය සම්පූර්ණයෙන්ම ඇර විනාඩි 2ක් පමණ ජලය අපතේ යවන්න. ඉන්පසු දැල්ලකින් කරාමය හොඳින් රත්කරන්න. එසේ නොමැතිනම් සර්ජිකල් ස්ප්‍රිට් වලින් කරාමයේ කට හොඳින් පිසදමන්න.කරාමය සිසිල් වීමට හැර ජල සාම්පලය එකතු කරන්න

### 1. 2. ළිඳකින් ජල සාම්පල ගැනීම.

ළිඳට සවිකල පොම්පයක් නොමැතිනම් බෝතලය කෙලින්ම ළිඳට බැස්සවිය යුතුය. ඒ සඳහා ඇලුමිනියම් කම්බියකින් බෝතලයේ කට ගැටගසන්න. දැල්ලක ආධාරයෙන් බෝතලයේ කට හා ඒ ආසන්න කම්බිය හොඳින් රත්කරන්න. දැන් බෝතලය ළිඳට දමා ජල සාම්පලය ගන්න. පොම්පයකින් ගන්නේ නම් සාම්පලය ගැනීමට පෙර පොම්පය ක්‍රියාකරවා විනාඩි දෙකකට වැඩි කාලයක් ජලය අපතේ හරින්න.

### 1.3. සාම්පල් ප්‍රවාහනය කිරීම හා ගබඩා කිරීම.

පැය 1කට නොවැඩි කාලයක් තුල සාම්පලය විද්‍යාගාරයට ගෙනඒමට නොහැකි නම් අයිස් සහිත පෙට්ටියකට දමා රැගෙන එන්න. මෙහිදී අයිස්වල ඇති බැක්ටීරියා ජල සාම්පලය සමග එකතුවීමට නොහැකි පරිදි සාම්පල් බෝතලය හොඳින් සිල් කරන්න. ඉන් පසුව පැය 24ට නොඅඩු කාලයක් තුල සාම්පලය විද්‍යාගාරයට ගෙන ආයුතුය.

### 2.0. ආහාර හා අනෙකුත් ද්‍රව්‍ය

2.1. ඇසුරුම්ගත ආහාර ද්‍රව්‍ය
ඇසුරුම්ගත ආහාර ද්‍රව්‍ය සාම්පල විවෘත නොකරන ලද ඇසුරුම්වලින් ලබාගත යුතුය. අවම වශයෙන් 250g පමණ තිබිය යුතුය..මේ සඳහා ජීවානුහරිත හැන්දක් හෝ වෙනත් සුදුසු උපකරණයක් යොදගන්න.

2.2. දියර සාම්පල (Bulk)
මුළු ද්‍රාවනයම නියෝජනය වන පරිදි නියැදිය ලබාගත යුතුය. මේ සඳහා ජීවානුහරිත හැන්දක් හෝ වෙනත් සුදුසු උපකරණයක් යොදගන්න.

2.3. ඝන හෝ අර්ධ ඝන ආහාර
මුළු නියැදියම නියෝජනය වන පරිදි ස්ථාන කිහිපයකින් සාම්පල ලබාගත යුතුය.

2.4. අධිශිතකළ ආහාර (Bulk)
ජීවානුහරණය කරන ලද තියුණු තලයක් ආධාරයෙන් සාම්පල් ගතයුතුය.

2.5. සාම්පල් ප්‍රවාහනය කිරීම හා ගබඩා කිරීම.
එකතුකරගත් නියැදි හැකි ඉක්මනින් විද්‍යාගාරයට ගෙනආ යුතුය. අධිශිතකළ හා ශිතකළ ආහාර එපරිද්දෙන්ම විද්‍යාගාරයට රැගෙන ආයුතුය. **($4\pm2^0C$)** උෂ්ණත්වය සාම්පලයේ රඳවා ගැනීමට වග බලාගන්න.

**සැලකිය යුතුයි**

ජලයේ රසායනික **(Chemical)** පරීක්ෂන සඳහා 1**L** ට නොඅඩු ජල පරිමාවක් වෙනමම බෝතලයකට සැපයිය යුතු වේ.